සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා,
    (1) කොණ්ඩඤ්ඤ නම් වේ. (2) කාලදේවල නම් වේ.
    (3) සර්වමිත්‍ර නම් වේ. (4) සුදත්ත නම් වේ.

02. ''බමුණ මම දෙවියෙක්, ගාන්ධර්වයෙක්, මනුෂ්‍යයෙක්, යක්ෂයෙක් නොවෙමි. මම බුද්ධ නම් වෙමි.'' බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ,
    (1) හුහුංක බමුණාට ය. (2) ද්‍රෝණ බමුණාට ය.
    (3) ජානුස්සෝණි බමුණාට ය. (4) සොත්ථිය බමුණාට ය.

03. බුදුජාණන් වහන්සේ දහවන වස් කාලය ගත කළේ,
    (1) බරණැස ඉසිපතන මිගදායේ ය. (2) විශාලා මහනුවර කූටාගාර ශාලාවේ ය.
    (3) පාරිලෙය්‍ය වනයෙහි ය. (4) රජගහනුවර වේළුවනාරාමයෙහි ය.

04. බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය දැක උන්වහන්සේ අනුගමනය කිරීමට යොමු වූ භික්ෂුව කවුද?
    (1) අනුරුද්ධ හිමි (2) ආනන්ද හිමි (3) ධර්මාරාම හිමි (4) වක්කලී හිමි

05. ගිලානෝපස්ථානය බුද්ධ චරිතයෙන් ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවූ අවස්ථාවකට නිදසුනක් වන්නේ,
    (1) මට්ටකුණ්ඩලී කථා පුවත ය. (2) රජ්ජුමාලා කථා පුවත ය.
    (3) සෝපාක කථා පුවත ය. (4) පූතිගත්තතිස්ස කථා පුවත ය.

06. නිවන් පසක් කිරීමට අවශ්‍ය වන මනා පිළිවෙත් රකින බැවින් සඟරුවන,
    (1) සුපටිපන්න නම් වේ. (2) උජුපටිපන්න නම් වේ.
    (3) ඤායපටිපන්න නම් වේ. (4) සාමීචිපටිපන්න නම් වේ.

07. සැරියුත් මහ රහතන් වහන්සේ බුදු සසුනෙහි පැවිදි වීමට පෙර පැවිදිව සිටියේ,
    (1) උපතිස්ස පිරිවැජියා සමීපයේ ය. (2) කෝලිත පිරිවැජියා සමීපයේ ය.
    (3) උපක ආජීවකයා සමීපයේ ය. (4) සංජය පිරිවැජියා සමීපයේ ය.

08. ''ආහාරෙ මත්තඤ්ඤුතා හෙවත් පමණ දැන ආහාර අනුභවය'' පිළිබඳ බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ලබාගත් රාජ්‍ය පාලකයා වන්නේ,
    (1) උදේනි රජතුමා ය. (2) කොසොල් රජතුමා ය.
    (3) බිම්බිසාර රජතුමා ය. (4) අජාසත් රජතුමා ය.

09. දාන පරමත්ථ පාරමිතා යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) තමා සතු භෞතික දෑ දන්දීමයි. (2) ශරීර අවයව දන්දීමයි.

(3) තම ජීවිතය දන්දීමයි. (4) අඹු දරුවන් දන්දීමයි.

10. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම් අතරට අයත් නොවන්නේ,

(1) මැනවින් හික්මවීමයි. (2) මැනවින් ඉගැන්වීමයි.

(3) තම මිත්‍රයන්ට හඳුන්වා දීමයි. (4) පවින් වැළැක්වීමයි.

11. තෙරුවන් ගුණ කීයද?

(1) නවයකි. (2) විසිහතරකි. (3) දහයකි. (4) විස්සකි.

12. ''චින්තාමය ප්‍රඥාව'' යන්නෙන් හැඳින්වෙන්නේ,

(1) සිතීමෙන් නුවණ දියුණු කර ගැනීමයි.

(2) පොතපත කියවීමෙන් නුවණ දියුණු කර ගැනීමයි.

(3) භාවනාවෙන් නුවණ දියුණු කර ගැනීමයි.

(4) ගුරුවරයාට සවන්දීමෙන් නුවණ දියුණු කර ගැනීමයි.

13. පංචස්කන්ධය හෙවත් නාම රූප හේතු කොට ගෙන ෂඩායතන (ආයතන හය) ඇතිවන බව හේතුඵල ධර්මයෙහි සඳහන් වේ. එම ආයතන හය,

(1) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම නම් වේ.

(2) රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, උපධි නම් වේ.

(3) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, ඉන්ද්‍රිය නම් වේ.

(4) චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන නම් වේ.

14. සංසාර නැමති සාගර තරණය කිරීමට ඉවහල් වන එසේම වැපිරිය යුතු බීජයක් ලෙස ද දක්වා ඇති නිවන් මඟට පිවිසීමට මුල්වන ධර්ම කරුණ වන්නේ,

(1) භක්තියයි. (2) තපසයි. (3) සද්ධාවයි. (4) ඔත්තප්පයයි.

15. ප්‍රතිසන්ධිය ලබා දීමට ඉවහල් වන කර්මය වන්නේ,

(1) උපපීඩක කර්මයයි. (2) උපඝාතක කර්මයයි.

(3) උපත්ථම්භක කර්මයයි. (4) ජනක කර්මයයි.

16. තණ්හාව මුල්කොට ගෙන සමාජයේ කලකෝලාහල ඇති වන බව සඳහන් සූත්‍ර දේශනාව කුමක් ද?

(1) මහා නිදාන සූත්‍රය (2) සිඟාලෝවාද සූත්‍රය (3) වසල සූත්‍රය (4) සතිපට්ඨාන සූත්‍රය

17. මංගල හා පරාභව සූත්‍රයන්හි සඳහන් ධර්මෝපදේශ වලින් ප්‍රකට වන අර්ථය ඇතුළත් වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) සිතීමට හා විමසීමට අනුබල ලබා දෙයි.

(2) මෙලොව පරලොව දියුණුවට හා පරිහානියට ඉවහල් වන කරුණු ඉදිරිපත් කරයි.

(3) නිවැරදි ධනෝපායන ක්‍රමෝපායන් පිළිබඳ උගන්වයි.

(4) යුතුකම් ඉටුකළ යුතු සමාජ කණ්ඩායම් පෙන්වා දෙයි.

18. චුල්ලකම්ම විභංග සූත්‍රයේ දැක්වෙන පරිදි අන් සැපතට ඊර්ෂ්‍යා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය වන්නේ,

(1) අඩු වයසින් මිය යාමයි. (2) පහත් යැයි සම්මත කුලවල ඉපදීමයි.

(3) අල්පේශාක්‍යව ඉපදීමයි. (4) දුර්වර්ණව ඉපදීමයි.

19. පරපණ නැසීම, සොරකම, වැරදි කාම සේවනය යන අකුසල් තුනෙන් වැළකීම අරි අටගි මගෙහි,
(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි.
(3) සම්මා ආජීවයයි. (4) සම්මා කම්මන්තයයි.

20. ත්‍රිශික්ෂාවේ සමාධි ශික්ෂාවට අයත් නොවන මාර්ග අංගය වන්නේ,
(1) සම්මා ආජීව යන්නයි. (2) සම්මා වායාම යන්නයි.
(3) සම්මා සති යන්නයි. (4) සම්මා සමාධි යන්නයි.

21. භාවනාවට යොමු වන පුද්ගලයා විසින් හිදීම, සිටීම, ඇවිදීම ආදී ඉරියව් පැවැත්වීම අවබෝධයෙන් සිදු කළ යුතුය. එය ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) ඉන්ද්‍රිය සංවරය නමිනි. (2) සති සම්පජඤ්ඤය නමිනි.
(3) වේදනානුපස්සනාව නමිනි. (4) කායානුපස්සනාව නමිනි.

22. පාලකයෙකු විසින් රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුව පහසුව කැප කරන්නේ නම් එය දස රාජධර්මවල හඳුන්වන්නේ,
(1) දානය ලෙසිනි. (2) සීලය ලෙසිනි. (3) පරිත්‍යාගය ලෙසිනි. (4) ඍජුබව ලෙසිනි.

23. ''මම සම්බුද්ධ වෙමි, ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා ද වෙමි.'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ විසින් කරන ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ උන්වහන්සේ,
(1) කායික රෝගවලට ප්‍රතිකාර කළ බවයි.
(2) ශල්‍යකර්ම සිදු කළ බවයි.
(3) උපස්ථායකයකු ලෙස කටයුතු කළ බවයි.
(4) මානසික රෝග නිවාරණයට මඟ පෙන්වූ බවයි.

24. ''මම තරුණවියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත.'' ආදී වශයෙන් පසුතැවීමට හේතුවන බව දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පද දෙක කුමක් ද?
(1) අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනෙ ධනං
(2) සුජීවං අහිරිකේන - කාකසුරෙන ධංසිනා
(3) තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
(4) අක්කොච්ඡි මං අවධිමං - අජිනී මං අහාසි මේ

25. උත්සාහනේ දැත දෙපයේ මහන්සියෙන්, දහදිය හෙළා ධාර්මික රැකියාවක නිරවීම .................. අතරින් හඳුන්වන්නේ,
(1) ආරක්ඛ සම්පදා නමිනි. (2) උට්ඨාන සම්පදා නමිනි.
(3) සමජීවිකතා නමිනි. (4) කල්‍යාණ මිත්තතා නමිනි.

26. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම,
(1) යහපාලනයයි. (2) පරාර්ථකාමී බවයි. (3) අර්ථචර්යාවයි. (4) සමානාත්මතාවයයි.

27. මංගල සූත්‍රයේ ''අනවජ්ජානි කම්මානි'' යන පාඨයෙන් කියැවෙන නිවැරදි කර්මාන්ත ගණයට අයත් නොවන්නේ,
(1) කෘෂි කර්මාන්තයයි. (2) ගව පාලනයයි. (3) රාජ්‍ය සේවයයි. (4) සත්ත්ව වෙළඳාමයි.

28. රට වැසියන් වශයෙන් ගෙවිය යුතු බදු මුදල් බුදු දහමේ හඳුන්වන්නේ,
(1) දේවතා බලි නමිනි. (2) පුබ්බපේත බලි නමිනි. (3) අතිථි බලි නමිනි. (4) රාජ බලි නමිනි.

29. පළමුවන ධර්ම සංගායනාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ,
(1) සබ්බකාමී තෙරණුවෝ ය. (2) මොග්ගලීපුත්ත තිස්ස තෙරණුවෝ ය.
(3) මහාකාශ්‍යප තෙරණුවෝ ය. (4) පාර්ශ්ව තෙරණුවෝ ය.

30. භික්ෂූන් වහන්සේලාට උගන්වා ඇති පරිදි උන්වහන්සේලා දන් වැළඳිය යුතු වන්නේ,
(1) මඳ වඩනු පිණිස ය. (2) පිළිවෙත් පිරීමට උපකාරයක් වනු පිණිස ය.
(3) ශරීරය සරසා ගනු පිණිස ය. (4) කඩවසම් වනු පිණිස ය.

31. බුද්ධ ප්‍රතිමා නිර්මාණය හා වන්දනා ජනප්‍රියවීමත් සමග ප්‍රතිමාවල ආරක්ෂාව සඳහා ගෘහයක් ඉදි වූ අතර එය,

(1) පටිමාඝර නමින් හැඳින්වේ. (2) චේතියඝර නමින් හැඳින්වේ.

(3) බෝධිඝර නමින් හැඳින්වේ. (4) පධානඝර නමින් හැඳින්වේ.

32. ''කියනුව දිවාරය - කෙරෙමි බුදුගුණ අලංකාරය'' යනුවෙන් වටිනා කාව්‍ය ග්‍රන්ථයක් රචනා කළ කතුවරයා,

(1) වීදාගම මෛත්‍රී හිමිය. (2) වැලිවිට සරණංකර හිමිය.

(3) තොටගමුවේ රාහුල හිමිය. (4) වැත්තෑවේ හිමිය.

33. තමා උපමා කොට අනුන් ගැන සිතන්නට උගන්වන ධම්ම පරියාය බුදුදහමේ හැඳින්වෙන්නේ,

(1) ලෝකාධිපති ධම්ම ලෙස ය. (2) අත්තූපනායික ධම්ම ලෙස ය.

(3) ධම්මාධිපති ධම්ම ලෙස ය. (4) අත්තාධිපති ධම්ම ලෙස ය.

34. බුදුදහම ස්ථාපිත වීමත් සමග ලංකාවේ ඉදිකළ මුල් ම ස්තූපය වන්නේ,

(1) ගිරිහඬු චෛත්‍යයයි. (2) කැළණිය චෛත්‍යයයි.

(3) ථූපාරාම චෛත්‍යයයි. (4) මහියංගන චෛත්‍යයයි.

35. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි කරුණක් නොවන්නේ,

(1) දේශීය භික්ෂු සමාජය ආරම්භ වීම ය.

(2) මහා විහාරය කේන්ද්‍ර කරගත් අධ්‍යාපනයක් ඇරඹීම ය.

(3) කැටයම් හා මූර්ති කලාවන් බිහි වීමය.

(4) මළවුන් පිදීම හා ගල් පර්වත වලට මිනිසුන් වන්දනා කිරීම ආරම්භ වීම.

36. ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය.'' මේ සටන් පාඨය පෙරදැරි කරගෙන කටයුතු කළ පාලකයා කවුද?

(1) වළගම්බා මහ රජතුමා (2) ධාතුසේන මහ රජතුමා

(3) මහ පැරකුම්බා මහ රජතුමා (4) දුටුගැමුණු මහ රජතුමා

37. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියැවුණේ,

(1) පොළොන්නරු යුගයේ දී ය. (2) දඹදෙණි යුගයේ දී ය.

(3) කුරුණෑගල යුගයේ දී ය. (4) අනුරාධපුර යුගයේ දී ය.

38. අනාබද්ධ බුද්ධ ප්‍රතිමාවකට නිදසුනක් වන්නේ,

(1) අවුකන බුද්ධ ප්‍රතිමාවයි. (2) මාලිගාවිල බුද්ධ ප්‍රතිමාවයි.

(3) සැස්සේරුව බුද්ධ ප්‍රතිමාවයි. (4) මොනරාගල බුද්ධ ප්‍රතිමාවයි.

39. ආම්ලකාකාර දාගැබක ගර්භයේ ස්වරූපය අනුව එය,

(1) නෙල්ලි ගෙඩියක හැඩය ගනී. (2) නෙළුමක හැඩය ගනී.

(3) කළයක හැඩය ගනී. (4) සීනුවක හැඩය ගනී.

40. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ පාලකයා වූයේ,

(1) මහසෙන් රජතුමා ය. (2) කිත්සිරිමෙවන් රජතුමා ය.

(3) පළමුවන විජයබාහු රජතුමා ය. (4) පළමුවන පරාක්‍රමබාහු රජතුමා ය.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) (i) සුදොවුන් මහරජු සිදුහත් කුමරුට තනා දුන් මාළිගා තුන නම් කරන්න.

(ii) ''චිත්තං සමේතීති සමථෝ'' මෙහි අර්ථය ලියන්න.

(iii) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(iv) දුටුගැමුණු මහ රජතුමා විසින් ඉදිකරන ලද ස්ථූප දෙකක් නම් කරන්න.

(v) ''ඉමස්මිං සති ඉදං හෝති, ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජතී'' මෙහි අර්ථය ලියන්න.

(vi) බුද්ධ වචනය අනුව රෝග දෙයාකාරය. නම් කරන්න.

(vii) බුද්ධ ප්‍රතිමාවක ආසන වර්ග කීපයක් දැක ගත හැකිය. ඉන් දෙකක් සඳහන් කරන්න.

(viii) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(ix) කුරුණෑගල යුගයේ දී ලියැවුන ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(x) බටහිර රටවලට බුදුදහම පිළිබඳ දැනුම බෙදා හැරීමට එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම (PALI TEXT SOCIETY) පිහිටුවා ගනු ලැබුවේ කවරහු ද?

(ලකුණු 2 x 10 = 20)

02 (අ) බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී මිනිසාගේ මෙලොව හිතසුව පිණිස පවත්නා කරුණු හතරක් දේශනා කළහ. ඒවා අතරින් දෙකක් නම් කරන්න.

(ආ) ඉහත (i) හි සඳහන් කළ එකක් කෙටියෙන් පහදන්න.

(ඉ) ව්‍යග්ඝපජ්ජ සූත්‍ර දේශනාව තුළ පුද්ගලයාගේ මෙලොව දියුණුවට මෙන්ම පරලොව ජීවිතයට අදාළ වන කරුණු රාශියක් විග්‍රහ වී තිබේ. විමසන්න.

(03) (අ) ''සුකරානි අසාධූනී.....'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ආ) එහි අර්ථය ලියන්න.

(ඉ) ධම්මපදය සමස්ථ මානව වර්ගයාට ම පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයක් සේ සැලකිය හැකිය. විමසන්න.

(04) (අ) බෞද්ධ භාවනාව දෙයාකාරය. නම් කරන්න.

(ආ) ඉහත සඳහන් කළ එක් භාවනාවක් කෙටියෙන් විස්තර කරන්න.

(ඉ) බෞද්ධ භාවනාව ප්‍රගුණ කිරීමෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ප්‍රයෝජන රැසකි. උදාහරණ දක්වමින් පහදන්න.

(05) (අ) තෙවන ධර්ම සංගායනාව සඳහා බලපෑ හේතු මොනවා ද?

(ආ) එම සංගායනාව සඳහා මූලිකත්වය, දායකත්වය ගෙන ක්‍රියා කළ අය සහ සහභාගී වූ පිරිස නම් කරන්න.

(ඉ) බුදු දහමේ ව්‍යාප්තිය පිණිස මෙම ධර්ම සංගායනාව කෙතෙක් දුරට ඉවහල් වූයේ දැයි විමසන්න.

(06) (අ) පොළොන්නරු යුගයේ රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(ආ) විද්‍යා චක්‍රවර්තීන් විසින් රචිත ග්‍රන්ථය නම් කර ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ඉ) සිංහල සාහිත්‍යයේ පෝෂණයට බුදු දහම කෙතෙක් දුරට ඉවහල් වූයේ දැයි විස්තර කරන්න.

(07) පහත සඳහන් කොටස් වලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(1) වැලිවිට අසරණ සරණ සරණංකර නාහිමි

(2) ස්තූපය

(3) සතර සංග්‍රහ වස්තු

(4) පාරමිතා

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(3) | 4 -(4) | 5 -(4) | 6 -(1) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(4) |
| 11-(2) | 12 -(1) | 13 -(2) | 14 -(3) | 15 -(4) | 16 -(1) | 17 -(2) | 18 -(3) | 19 -(4) | 20 -(1) |
| 21-(2) | 22 -(3) | 23 -(4) | 24 -(1) | 25 -(2) | 26 -(3) | 27 -(4) | 28 -(4) | 29 -(3) | 30 -(2) |
| 31-(1) | 32 -(1) | 33 -(2) | 34 -(3) | 35 -(4) | 36 -(4) | 37 -(3) | 38 -(2) | 39 -(1) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01. (i) රම්‍ය, සුරම්‍ය, සුභ

(ii) සිත සන්සුන් කරන්නේ සමථයයි.

(iii) මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රතනත්‍රය ප්‍රජාව ගාථා සන්නය, සතර බණවර සත්තය

(iv) මිරිසවැටිය, රුවන්වැලි මහා සෑය

(v) මෙහි ඇති කල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදී

(vi) කායික රෝග, මානසික රෝග

(vii) වීරාසන, පද්මාසන, භද්‍රාසන

(viii) දානය, ප්‍රියවචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව

(ix) පන්සිය පනස් ජාතක පොත, සිංහල බෝධි වංශය, ථූපවංශය

(x) රීස් ඩේවිඩ්ස් පඬිතුමා

02. (අ) උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කළ්‍යාණමිත්තතා, සමජීවිකතා

(ආ) • <u>උට්ඨාන සම්පදා :-</u> තමන් කරන කවර හෝ රැකියාවක්, උත්සාහයෙන් දෑතේ දෙපයේ වීර්යයෙන් දහදිය වගුරුවා සිදු කිරීම.

• <u>ආරක්ඛ සම්පදා :-</u> ධාර්මිකව උපයාගත් ධනය විනාශ විය හැකි ක්‍රම වලින් විනාශ වීමට ඉඩ නොදී මැනවින් ආරක්ෂා කර ගැනීමයි.

• <u>කළ්‍යාණමිත්තතා :-</u> යහපත් මිතුරන් ඇසුරු කිරීම ''කල්‍යාණ මිත්තතා'' යන්නෙහි අදහසයි. මෙහි දී සැලකිලිමත් විය යුත්තේ මිත්‍රයාගේ වයස හෝ තරාතිරම හෝ නොව යහපත් ගතිගුණ කෙරෙහිය. ඔවුන් තුළ සද්ධා සීල, චාග, පඤ්ඤා යන ගුණ ධර්ම තම ජීවිතයටත් සමීප කර ගැනීම කළ්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය තුළින් අපේක්ෂා කෙරේ.

• <u>සමජීවිකතා :-</u> තමාගේ ආදායම හා වියදම හොඳින් දැන ආදායමට වඩා වියදම් වැඩි නොකට අයවැය මනාව තුලන කර ගැනීම සමජීවිතතාවය.

(ඉ) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ඉහත කරුණු සියල්ලම පාහේ ලෞකික ජීවිතය සාර්ථක කර ගැනීමට උපකාරී වේ. දැහැමිව උපයන ධනය මැනවින් ආරක්ෂා කර ගැනීමෙන් යහපත් ජීවිතයක් ගත කළ හැක. ශ්‍රද්ධා දී ගුණ ධර්ම ඇති කළ්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් ගුණ යහපත් පුද්ගලයෙකු ලෙස ජීවිතය සාර්ථක කර ගැනීමට පුළුවන. සද්ධා, සීලා දී ගුණ ධර්ම වර්ධනයෙන් යුතුව දිවි ගෙවීමෙන් පරලොව ජීවිතය සාර්ථක වේ. (11 ශ්‍රේණිය 62 සිට 68 පිටු)

(ලකුණු 2 + 3 + 5)

03. (අ) සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච
යං වෙ හිතං ච සාධුංච - තං වෙ පරම දුක්කරං

(ආ) තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුය. යම් දෙයක් තමාට වැඩ දායක ද, යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසුය.

(ඉ) ධම්ම පදය සියලු දෙනාට පරිහරණය කළ හැකි වටිනා උපදෙසා ඇතුළත් ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකිය. පුද්ගල ජීවිතය සාර්ථක කරගැනීමට අදාල උපදෙස් ධම්මපදයෙහි ඇතුළත්ය. ධම්මපද ගාථා මගින් ඉදිරිපත් කර ජීවිතාදර්ශ මානව වර්ගයාටම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි ආචාර ධර්ම වේ. (උදාහරණ දක්වමින් ලියා ඇත්නම් උසස් පිළිතුරක් ලෙස සලකන්න.) (11 ශ්‍රේණිය 49 - 55 පිටු)

(ලකුණු 2 + 3 + 5)

04. (අ) සමථ, විදර්ශන (චිත්ත / සමාධි) (ප්‍රඥා / ත්‍රි ලක්ෂණ / විපස්සනා)

(ආ) • සමථ භාවනාව :- සිත දියුණු කෙරෙන නිසා, චිත්ත භාවනාව යනුවෙන් ද, සිත සමාධි ගත කෙරෙන නිසා සමාධි භාවනාව යනුවෙන් ද හැඳින්වේ. සමථය තුළින් සිත, දූෂණය වන කෙලෙස් සතුරන් සංසිඳුවීමත්, කුසල් සිත් දියුණු කිරීමෙන් සිත දියුණු කිරීමත්

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

සිදුවේ. පංච නීවරණ යටපත් වේ. සමථ භාවනාව වැඩීමෙන් ලැබෙන උසස්ම ඵලය පංච අභිඥා ලබා ගැනීම සහ අෂ්ඨ සමාපත්තිය ලබා ගැනීමයි.

- විදර්ශනා භාවනාව :- පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීම විපස්සනා භාවනාවයි. ජීවිතය සහ ලෝකය ත්‍රි ලක්ෂණයට අනුව බලමින් මෙම භාවනාව වැඩීම තුළින් ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ කර ගත හැක.

(ඉ)
- භාවනාව යනු වැඩීමයි. කුසල් සිත් වැඩීමයි. බුදු දහමේ සමථ විදර්ශනා යනුවෙන් භාවනා ක්‍රම දෙකකි. සමථ භාවනාව වැඩීමෙන් කෙලෙස් යටපත් වෙයි. එවිට මෙලොව වශයෙන් සාර්ථක ජීවිතයක් ගත කිරීමට හැකි වෙයි. මෙයට අමතරව භාවනාව ප්‍රගුණ කිරීමෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ප්‍රයෝජන රැසකි.
- මතක ශක්තිය දියුණු වීම, එක අරමුණක සිටීමට හැකි වීම ගැටළු විසඳීමේ ශක්තිය දියුණු වීම, මනා අවබෝධ කර ගැනීමේ ශක්තිය දියුණුවීම, ඉවසීමේ ශක්තිය දියුණු වීම, පිළිවෙලින් යමක් ඉදිරිපත් කිරීමට හැකි වීම. (මෙම කරුණු වලින් අවම වශයෙන් තුනක් වත් ගෙන විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.) (11 ශ්‍රේණි 31 - 40 පිටු)

(ලකුණු 2 + 3 + 5)

05. (අ) ලාභ සත්කාර ආදියට ගිජු වූ අන්‍ය තීර්මිත පිරිස් ශාසනයට ඇතුළත්වීම නිසා සිල්වත් භික්ෂූන්ට විනය කර්ම කිරීමට නොහැකි විය. මේ හේතුවෙන්, දුසිල් මහණුන් නෙරපීම සඳහාත්, බුද්ධ ධර්මය ආරක්ෂා කර ගැනීම සඳහා ය.

(ආ) මූලිකත්වය - මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ
දායකත්වය - ධර්මාශෝක මහ රජු / අශෝක මහ රජු
සහභාගී වූ පිරිස - මහරහතන් වහන්සේලා දහසකි (1000)

(ඉ) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස බුදු දහමේ දේශාන්තර ව්‍යාප්තිය සිදුවිය. භාරතයේ මධ්‍ය දේශයට පමණක් ප්‍රත්‍යන්ත ප්‍රදේශ වලටත්, වෙනත් රටවලටත් බුදු දහම ව්‍යාප්ත වූයේ සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි. අශෝක රජුගේ මෙහෙයවීමෙන් රටවල් 9 කට ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර හැරීම නිසා ලංකාව වැනි රටවලට ස්ථිරසාර දහමක් ලැබුණේ ද මේ හෙයිනි. (රටවල් 9 අතරින් කීපයක් නම් කර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.) (11 ශ්‍රේණිය 114 - 115 පිටු)

(ලකුණු 2 + 3 + 5)

(06) (අ) අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ, දුවදෙවිදාවත, සසදාවත

(ආ) බුත්සරණ - බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදු ගුණ වර්ණනා කරන විද්‍යා චක්‍රවර්තීන්. ''බුදුන් සරණයෙමින් බුත්සරණ යා යුතු'' යනුවෙන් දක්වා තිබේ. ග්‍රන්ථය ආරම්භයේ දී ය. බුද්ධ චරිත ජාතක කථා, නව අරහාදී බුදු ගුණ, බුදුරදුගේ දේශනා විලාශය විස්තර කර ඇත. ග්‍රන්ථය ගීතවත් බවකින් නිර්මාණාත්මකව ඉදිරිපත් කර ඇත. අංගුලිමාල දමනය, නාලාගිරි දමනය ඉතා විසිතුරුව නිර්මාණාත්මවක ඉදිරිපත් කර ඇත.

(ඉ) සිංහල සාහිත්‍ය පෝෂණය වූයේ බණ කතා සාහිත්‍යයක් වශයෙනි. පැරණි යුගයේ සාහිත්‍ය කෘති සෑම එකක්ම පාහේ සවන් දීමේ රුචිය වර්ධනය වන ලෙස නිර්මාණය කරන්නට උත්සහ කළ බවක් දක්නට ලැබේ. මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කළ පසු ඒ ආකාරයෙන් සිදු වූ ග්‍රන්ථකරණය අනුරාධපුර සාහිත්‍ය යුග ආදී, සාහිත්‍ය යුග වශයෙන් දක්වෙන අතර, කුරුණෑගල යුගයේ දී සිංහලයට පරිවර්තනය වූ ජාතක පොත් වහන්සේ සිංහල සාහිත්‍යයේ පෝෂණයට බෙහෙවින් ඉවහල් වූ බව කිව යුතුයි. (පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.)

(ලකුණු 2 + 3 + 5)

07 (1) <u>වැලිවිට අසරණ සරණ සරණංකර මාහිමි</u>

1698 ජූනි මස 18 දින උඩරට දම්පනේ ප්‍රදේශයේ වැලිවිට ග්‍රාමයේ කුලතුංග බණ්ඩාර නමින් උපත ලැබූ මොහු වයස අවුරුදු 16 දී පමණ වැලිවිට සරණංකර නමින් පැවිදි බිමට පත්විය. උන්වහන්සේ ඉගෙනුම ලැබූවේ තම උත්සහයෙනි. භාෂා ශාස්ත්‍රයන් වශයෙන් සිංහල, පාලි, සංස්කෘත, බුද්ධධර්මය, කාව්‍ය ශාස්ත්‍රය හා තවත් බොහෝ විෂයයන් පිළිබඳ හසල දැනුමක් ලබා ගත්හ.

ශික්ෂාකාමී, අල්පේච්ඡ ජීවිතයකට හුරු වූ උන්වහන්සේ යැපුනේ පිණ්ඩපාතයෙනි. එසේ ජීවිත ගත කළ උන්වහන්සේ ගම් නියම් ගම් කරා වැඩම කොට දහම් දෙසමින් අසරණයන්ට සරණංකර හිමි යනුවෙන් ප්‍රසිද්ධ වූහ. මහනුවර යුගයේ ඇති වූ ශාසනික පරිහානිය හේතුවෙන් සසුන නගා සිටුවීම සඳහා ශාසනමාමක පිරිස්

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

එකතු කොට සිල්වත් සමාගම පිහිටුවා ගත්හ.

කීර්ති ශ්‍රී රාජසිංහ යුගයේ දී මෙරටට සියම් දේශයෙන් උපසම්පදාව රැගෙන විත් මෙහි පිහිට වූ අතර 1753 දී උන්වහන්සේ ඇතුළු හය නමක් උපසම්පදාව ලබා ගත්හ. උන්වහන්සේගේ මහා ශාසන මෙහෙවර නිසා කීර්ති ශ්‍රී රාජසිංහ රජු උන්වහන්සේට සඟරාජ පදවිය පිරිනමා ඇත.

අල්පේච්ඡ ජීවිතයක් ගත කළ උන්වහන්සේ සර්ව ශාස්ත්‍රීය සේවාවකද, නියැලුන අතර, මුනිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රතනසූත්‍ර ප්‍රණාම ගාථා, සතර බණවර සන්නය රදනා කළහ. උන්වහන්සේ අවුරුදු 80 ක් ආයු වළඳා 1778 දී අපවත් වී වදාළහ. (ලකුණු 05)

(2) <u>ස්තූපය</u>

විහාරාරාංග අතරින් ස්තූපය ඉතා වැදගත් අංගයකි. බුදු, පසේ බුදු, මහරහත් යන උතුමන්ගේ ධාතු සහ විවිධ පූජා වස්තු තැන්පත් කර ස්තූප ගොඩනගනු ලබයි. ලක්දිවට බුදු දහම ලැබීමත් සමඟ මෙරට ඉදි වූ මුල්ම දාගැබ ථූපාරාමයයි. අනතුරුව සෑම වෙහෙර විහාරස්ථානයකම පාහේ ස්තූප ගොඩනැගෙන්නට විය. ස්තූපයේ ආකෘති හෙවත් ආකාර 6 ක් දක්නට ලැබේ. ඒවා අතරින් අද ලංකාවේ දක්නට ලැබෙන්නේ, ඝණ්ඨාකාර, බුබ්බුලාකාර, ධාන්‍යාකාර ස්තූප පමණි. කලාත්මක බවින් යුක්ත ස්තූපයක අංග දැක ගත හැකිය. (තුන් මහල් සේයාව / ගර්භය / සතරැස් කොටුව / දේවතා කොටුව / කොත් කැරැල්ල / කොත) පසු කාලීනව ස්තූපය සමඟ වටදාගෙය, වාහල්කඩ, ආසන, සලපතන මළුව ආදී දෑ එකතු විය. (ලකුණු 05)

(3) <u>සතර සංග්‍රහ වස්තු</u>

සතර සංග්‍රහ වස්තු නම්, දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවයි.

- දානය :- පුද්ගල චරිත සංවර්ධනය සඳහා බෙහෙවින් උපකාරී වේ. දානය යනු පරිත්‍යාගයයි. එය පිරිසිදු සිතින් දෙන දානයයි. පාලකයා විසින් රටේ ජනතාවයේ අභිවෘද්ධිය උදාකරලීමේ අරමුණෙන් ප්‍රාග්ධනය සැපයීම මෙයට ඇතුළත්ය.
- ප්‍රිය වචනය :- ප්‍රිය වචන කථා කිරීමයි. වචනයෙන් සිදුවන වැරදිවලින් මෙත් වී කතා කිරීමයි. එනම් බොරුවෙන්, කේලමෙන්, පරුෂවචනයෙන්, හිස් වචනයෙන් තොර වීමයි, රාජ්‍ය පාලකයෙක් ප්‍රියශීලී, කනට මිහිරි වචන කථා කළ යුතුය.
- අර්ථ චර්යාව :- අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීමයි. මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා යන සිව්බඹ විහරණයෙන් යුක්තව ජනතාවට අර්ථවත් සේවාවක් සපයමින් කටයුතු කිරීම.
- සමානාත්මතාව :- සියලු සත්ත්වයන් පිළිබඳව සම සිතින් කටයුතු කිරීමයි. විවිධ ජාති ආගම්, භාෂා අනුව වර්ග වී සිටින සියලු දෙනා වෙත අයිතිවාසිකම් හා සුරක්ෂිත වන ලෙස සමානව කටයුතු කිරීමයි. (ලකුණු 05)

(4) <u>පාරමිතා</u>

නිවනට පමුණුවන පිළිවෙත් පාරමිතා නම් වේ. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරනු ලබන පිළිවෙත් යන අර්ථයෙන් ද පාරමිතා යැයි කියනු ලැබේ. ඒවා කුසල ධර්ම ගණයට වැටේ. පාරමිතා දහයකි. ඒවා නම් දාන, සීල, නෙක්ඛම්ම, ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෙත්තා, උපෙක්ඛා යි.

පාරමිතා ගුණ ධර්ම පුහුණු කරන්නෙක් කරුණු පහකින් සම්පූර්ණ කරයි. තණ්හාවෙන් තොරව දාන සීලාදී ගුණ ධර්ම පිරීම, මානයෙන් තොරව එම ගුණ ධර්ම පිරීම, මිථ්‍යා දෘෂ්ටියෙන් තොරව එම ගුණ ධර්ම පිරීම, කරුණාවෙන් යුක්ත ව දාන සීලා දී ගුණධර්ම පිරීම, උපාය කෞශල්‍ය ඥානයෙන් යුක්තව එම ගුණ ධර්ම පිරීම කළ යුතුය.


පාරමිතා සම්පූර්ණ කරන බෝසත්වරු, පාරමිතා පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී යනුවෙන් තුන් වැදෑරුම්ව සම්පූර්ණ කරනු ලබන අතර, සම්බුද්ධ, පච්චේක බුද්ධ අරහන්ත බුද්ධ යන ත්‍රිවිධ බෝධිය සඳහා එම පාරමිතා සම්පූර්ණ කරනු ලබයි. (ලකුණු 05)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371







































LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




මිට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්වා ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

